// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1916/28 - 2015 මැයි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2015.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

### බලය පැවරීමේ නියෝගය

උතුරු මැද පළාත් සභාවේ 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත, සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ රංජිත් සමරකෝන් වන මම උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ බලතලවලින් උතුරු මැද පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීමට සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා පත්කර ඇත්තා වූ පහත සඳහන් උප ලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් අය වෙත එම උප ලේඛනයේ III වැනි තීරුවෙහි සඳහන් සියලු බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

සමරකෝන් මුදියන්සේලාගේ රංජිත් සමරකෝන්,
ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු,
සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍ය,
උතුරු මැද පළාත.

2015 අප්‍රේල් මස 01 වැනි දින.

#### උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| රාජකරුණා වීරසිංහ බන්දුසේන | 2015.04.01 | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58, 58 (3), 58 (4) හා 58 (5) හැර, 59 වගන්තියේ (1) ආ හැර යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16 (II), 19, 33, 35, 37, 39, 40, 41(I) අ හැර, 42, 49, (49 XII) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |

1A - PG 2477 — 08 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| කොස්ගොඩ පතිරණගේ චාමින්ද ධර්මතිලක | 2015.04.01 | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමග කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58, 58 (3), 58 (4) හා 58 (5) හැර, 59 වගන්තියේ (1) ආ හැර යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16 (II), 19, 33, 35, 37, 39, 40, 41(I) අ හැර, 42, 49, (49 XII) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |

06 - 376

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.